699

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන 2022/2023

5 වන මට්ටම - අවසාන පරීක්ෂණය

**EPU5557 - ප්‍රාථමික පාසල් ගුරුවරුන් සඳහා පළමු භාෂාව - සිංහල**

**කාලය - පැය තුනයි. (03)**

---

**දිනය - 2024.03.03** **වේලාව - ප.ව.09.30 - ප.ව.12.30 දක්වා**

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරාගනු ලබන ප්‍රශ්න තුනකට (03) ද පමණක් පිළිතුරු සපයන්න.

## 01- කොටස

01. **"භාෂාව සමාජ නිර්මිතයකි"** මෙම අදහස ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

02. "සමාජ විවිධතා මත ඇතිවන්නා වූ භාෂා විවිධතා ප්‍රධාන ප්‍රභේද දෙකක් යටතේ හඳුනාගත හැකි ය." එම ප්‍රභේද දෙක (02) නම් කරන්න.

03. කමත් භාෂාවේ භාවිත කරන වචන **පහක් (05)** සඳහන් කර එම වචන පහ (05) සඳහා සාමාන්‍ය ව්‍යවහාරයේ භාවිත කරන වචන අදාළ වචනය ඉදිරියෙන් ලියන්න.

04. ප්‍රාථමික අධ්‍යාපන අවධියේ දරුවන් තුළින් ඔබ හඳුනාගන්නා ලද ලිවීමේ දුර්වලතා **පහක් (05)** සඳහන්කර එම එක් එක් දුර්වලතාව පැහැදිලි කිරීම සඳහා උදාහරණයක් බැගින් ලියන්න.

05. සිදත් සඟරා හෝඩියේ ඇතුළත් ගාත්‍රාක්ෂර හෙවත් ව්‍යංජනාක්ෂර ලියා දක්වන්න.

06. පහත සඳහන් වචනය ලියා එම වචනය සෑදීමට අදාළ වී ඇති සන්ධි වර්ගය ඉදිරියෙන් ලියන්න.

| වචනය | අදාළ සන්ධිය | වචනය | අදාළ සන්ධිය |
|---|---|---|---|
| ගුරුතුමා | | ලිග්ගල | |
| නිලඹර | | වල්ලම්බලම | |
| ගෙත්තම | | | |

07. දෙවන ශ්‍රේණියේ සිසුන්ට යෝග්‍ය ළමා කතන්දරයක් තෝරා ගැනීමේ දී ගුරුවරයෙකු ලෙස ඔබ සලකා බැලිය යුතු කරුණු **පහක් (05)** ඉදිරිපත් කරන්න.

08. නිර්මාණාත්මක ලේඛනයේ දී නිර්මාණකරුවෙකු සතු විය යුතු වැදගත්ම හා ප්‍රධානතම ගුණාංගය ලියන්න. එම ගුණාංගය ඔබේ පාඨමාලාවේ වෙනත් අයෙකුට පැහැදිලි කරන ආකාරය ලියන්න.

(ලකුණු 5 X 8 = 40)

## 02- කොටස

09. (i.) භාෂාවේ සමාජීය කාර්යය හා ආත්මීය කාර්යය වෙන වෙනම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 06)

(ii.) ඔබෙන් ඉගෙනුම ලබන සිසුන් තුළ භාෂාවේ සමාජීය කාර්යයන් සංවර්ධනය කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු - 08)

(iii.) "ප්‍රාදේශීය උප භාෂා පිළිබඳ ව අවබෝධය ගුරුවරයෙකුට අවශ්‍ය වේ." කරුණු තුනක් **(03)** ඉදිරිපත් කරමින් මෙම අදහස තහවුරු කරන්න. (ලකුණු - 06)

10. (i.) සන්නිවේදනයෙහි ලා භාෂාව සතු ගුණාංග තුනක් (03) පහත සඳහන් කර ඇත. එම ගුණාංග තුන **(03)** කෙටියෙන් සාකච්ඡා කරන්න.

- ❖ ශබ්ද අර්ථ දෙකේ ඇති අපූර්ව සංවිධානාත්මකභාවය
- ❖ රූඪීකෘත ස්වභාවය
- ❖ භාෂාව සංස්කෘතියෙන් උරුම වීම (ලකුණු - 10)

(ii.) පහත සඳහන් කරන ක්‍රියාවලි දෙකෙහි දී **(02)** භාෂාව වැදගත් වන ආකාරය උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.

- ❖ සංස්කෘතිය පවරාදීමට
- ❖ බුද්ධි වර්ධනයට (ලකුණු - 10)

11. (i.) නූතන සිංහල අක්ෂර මාලාවේ පවතින **අල්පප්‍රාණ අක්ෂර, මහප්‍රාණ අක්ෂර, ඝෝෂ අක්ෂර** වෙන වෙන ම ලියා දක්වන්න. (ලකුණු - 10)

(ii.) අක්ෂර වින්‍යාස රීති හතරක් ලියා, එම එක් රීතියක් අදාළ දින පාසලට සහභාගි නොවූ අයෙකුට පැහැදිලි කරන ආකාරය පියවර වශයෙන් දක්වන්න. (ලකුණු - 10)

12. (i.) ප්‍රාථමික අධ්‍යාපන අවධියේ දෙවන ශ්‍රේණියේ සිසුන් සමඟ රසවින්දනය සඳහා තෝරා ගන්නා ළමා කවියක/ ගීතයක තිබිය යුතු ලක්ෂණ හතරක් **(04)** ලියන්න. (ලකුණු - 02)

(ii.) ළමා කවි, ගී ශිෂ්‍යයින්ගේ චින්තන කුසලතාව වර්ධනය සඳහා ගුරුවරයෙකු ලෙස භාවිතයට ගන්නා ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු - 08)

(iii.) ළමා ගීතයක් නම් කර එමගින් සිසුන්ගේ දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනය කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 10)

13. (i.) නිර්මාණාත්මක ලේඛකයෙකු සතු විය යුතු ලක්ෂණ හතරක් **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 10)

(ii.) ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිසුන් තුළ නිර්මාණාත්මක ලේඛන කුසලතාව සංවර්ධනය සඳහා ගුරුවරයෙකු ලෙස ඔබ ක්‍රියාකරන ආකාරය ළමා කවි, ළමා ගී, ළමා කතන්දර යන එක් සාහිත්‍යාංගයක් ඇසුරු කරගෙන පැහැදිලි කරන්න. (ලකුණු - 10)

හිමිකම් ඇවිරිණි.